DOI: https://doi.org/10.4038/kalyani.v36i2.71

*KALYĀṆĪ: Journal of the University of Kelaniya, ISSN - 2012-6859, Volume XXXVI (Issue II), 2022*

# The father's role portrayed in Sinhala lyrics: An exploratory study

Nadeesha Weerasinghe[1]

## Abstract

Studies on songs determine that modern lyrics take on a paradoxical form far from reality in their reconstruction of individual life. That is why the literature quality of song lyrics on social development has become a research- oriented issue in the modern world. The objective of the research is to study whether the lyrics portray the reality of the father's role and the modern father's role in social transformation. Social literary theory, gender theory and post-colonial theory were used for analysing data. Literature review and interviews were used as methodology under the qualitative research methodology. Sample of this research consists of lyrics of Sunil Sarath Perera, Yamuna Malini Perera and Rathna Sri Wijesinghe which were highly valued about this theme. Lyricists have tended to recreate the role of the man, the role of fatherhood in the traditional society in its conservative form as well as the modern challenges. The study revealed a minimal focus on the modern challenging role of the father and a shift away from the concept of lyricist leading more towards artistic and empirical status for more harmonious social image. The comparative study revealed that the representation of reality is based on the wholeness of one's life consciousness and social outlook. The study traced that all three lyricists are concerned with the realistic portrayal of father's role by focusing on the quality as well as the number of songs.

**Keywords:** *Capitalist Social Transformation, Lyrics, Transformation of father's role*

[1] පශ්චාත් උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
nadeeshaweerasinghe98@gmail.com

# සිංහල ගීත පද රචනාවලින් නිරූපිත පිතෘ භූමිකාව: විමර්ශනාත්මක අධ්‍යයනයක්

නදීෂා වීරසිංහ

## 1. හැඳින්වීම

ගී පද රචනය, සංගීතය සහ ගායනය යන ත්‍රිත්වයෙන් සමන්විත වූ සාමූහික කලා මාධ්‍යයක් වන ගීතය බිහි වන්නේ විවිධ අනුභූති ඇසුරින් ගීත රචකයාගේ මනෝවෘද්ධියේ ය. ජනවිඥානය ගීතය නිර්වචනය කරන්නේ වින්දන කලාංගයක් ලෙස ය. එහෙත් එය හුදෙක් වින්දනයට ම සීමා නොවූ බුද්ධි විෂයික භූමිකාවක් ද සහිත කලාංගයකි. ගීතයක මතුපිටින් ග්‍රහණය කරගන්නා ස්වභාවය ඉක්ම වූ කෘත්‍යයක් ගීතය සතු ය. එහි ප්‍රඥුව සහ ආනන්දය අන්තර්ගත වී ඇත්තේ, භාෂාව මාධ්‍යය කරගත් සාහිත්‍යය පාර්ශවය වූ ගීත පද මාලාව නම් පයීතමය මාධ්‍යය තුළ යි. එය ගීතයේ භාෂාත්මක සන්නිවේදන පාර්ශවය යි.

ගේය කාව්‍ය යනු සමස්ත විශ්වය පුරා මහත් සේ ජනප්‍රියත්වයට පත් ව තිබෙන ගීතය නමැති කලා මාධ්‍යයෙහි සාහිත්‍ය පාර්ශවය යි (ආරියරත්න, 2018). සංගීතය ගීතයේ ශ්‍රව්‍යමය රිද්මයානුකූලත්වය ගොඩනගයි. එහි අර්ථමය සංනිවේදනය සඳහා දායක වන්නේ භාෂාව යි. ගේය පද රචනය යනු චිත්තවේගීමය හෝ ගුණාත්මකභාවය වැනි ගේය කාව්‍යයේ ගීතමය සූක්ෂ්මතාව යි.

පෞද්ගලික මෙන් ම පොදු සමාජ ව්‍යුහයේ පවතින සිදුවීම් ද ගීතයේ වස්තු විෂය ගොඩනගයි. එම සමාජයේ මූලික සාධකය ද, සමාජ ව්‍යුහයේ තීරක සාධකය ද වන්නේ පවුල යි. විශ්වීය සංකල්පයක් වන පවුල පුද්ගල අවශ්‍යතා සපුරන, හුදෙක් පුද්ගලයන් සමූහයක් පමණක් ම නොව, අරමුණක් උදෙසා සංවිධානය කර මෙහෙයවනු ලබන සාරධර්ම සහ ධර්මතාවන්ගේ සංවිධානයකි. ජෝර්ජ් පීටර් මර්ඩොක් අනුව පවුල යනු සමාජීය පොදු පදිංචිය, ආර්ථික සහයෝගීතාව සහ ප්‍රජනනය මගින් සමන්විත කණ්ඩායමකි. මුල් අවධියේ පරම්පරා කිහිපයක් එක් ව වාසය කළ විස්තාරිත පවුල් තිබී ඇත. ප්‍රංශ විප්ලවය, කාර්මික විප්ලවය,

ගෝලීයකරණය වැනි සමාජ විපරිවර්තන හමුවේ සිදු වූ ක්‍රමික සමාජ විකාශනයේ ප්‍රතිඵලයක් ලෙස විස්තාරිත පවුල් සංකල්පය, න්‍යෂ්ටික පවුල් සංකල්පයක් බවට පත් විය. මව- පියා- දූදරුවන් පමණක් සිටින එම පවුලේ සාමාජිකයන් ප්‍රමාණය සීමිත විය. ලංකාවේ ද යටත්විජිත ධනේශ්වර ක්‍රමය මගින් සීමිත සාමාජිකයන් ප්‍රමාණයක් සිටින න්‍යෂ්ටික පවුල වැදගත් ය යන ආකල්පය සමාජගත කළේ ය. ගම සහ නගරය අතර වෙනස නිර්මාණය කරමින්, පවුල් වශයෙන් නගරයට ගෙන්වා ගැනීමේ පහසුව ද උදෙසා විද්‍යාත්මක සහ තාක්ෂණික ක්‍රම භාවිත කරමින් න්‍යෂ්ටික පවුල් සංකල්පය පිළිබඳ ආකල්පය සමාජගත කළේ ය.

විසි වන සියවසේ දී මෙරට ඇති වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග සමාජයේ අධෝ ව්‍යුහය ලෙස ආර්ථිකය ප්‍රබල භූමිකාවක නිරත වීමෙන් පවුලෙහි මූලික අවශ්‍යතා සංකීර්ණ වීම සමග පවුලේ කෘත්‍යයන්ගේ විස්තාරණය වීමක් සිදු විය. කාර්යබහුල ජීවිතය තුළ මව්පිය- දූ-දරු සබඳතා දුරස් වීම මත අනාරක්ෂිත බව, විවාහ සබඳතා පලුදු වීම වැනි ගැටලු සමාජයේ ඇති වී තිබේ. දරුවන් සමාජානුයෝජනය කිරීම, සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම වැනි ගැටලු රාශියකට ද සමාජයක් වශයෙන් මුහුණ දෙමින් සිටියි. මෙම ප්‍රායෝගික ප්‍රශ්න දෙස විචක්ෂණශීලී වන ගීත රචකයන් 70 දශකයේ පමණ සිට සුලබ ය. ගීත සාහිත්‍යයේ දියුණු අවධියක් වූ 70-80 දශකද්වය පවුල් සංස්ථාවේ යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමෙහි නිරත වීම සාපේක්ෂ ව ඉහළ ප්‍රවණතාවක් විද්‍යමාන කළේ ය.

ගීතයේ ප්‍රාරම්භක අවධියේ සිට ම කේන්ද්‍රීය සමාජ සංස්ථාව වන පවුලෙහි පවතින සංවේදී මානව සබඳතා සහ අර්බුද වස්තු විෂය ලෙස යොදා ගෙන ඇති බව පැහැදිලි ය. පවුල් සංස්ථාවේ වාස්තවික නො වූ ගැටලු ප්‍රතිනිර්මාණය කිරීම විෂයයෙහි අවධානය යොමු කරමින් ගීත රචනයේ නිරතවන ගී පද රචකයින් සියලු ම දෙනා මෙහි සාකච්ඡා කිරීම දුෂ්කර කර්තව්‍යයකි. මෙම තේමාවෙන් ගීත නිර්මාණය කිරීම ප්‍රමාණාත්මක ව ඉහළ අගයක් ගත් අවධීන් කිහිපකින් ස්ත්‍රී- පුරුෂ නියෝජනය ද වන පරිදි ගීත රචකයින් තිදෙනෙක් තෝරාගෙන ඇත. ඒ සඳහා සිංහල ගීතයේ සුවිශේෂ අවධියක් වූ 70 දශකයේ කලාවට

අවතීර්ණ වූ පද රචකයින් වන සුනිල් සරත් පෙරේරා සහ රත්න ශ්‍රී විජේසිංහ ද, ගී පද රචිකාවක වූ යමුනා මාලිනී පෙරේරා යන ගීත රචකයින් තිදෙනාගේ ගීත සංග්‍රහවල ඇතුළත් පිතෘ භූමිකාව පිළිබඳ ලියැවුණු ගීත අධ්‍යයනයට යොදා ගැනිණි. ගී පද රචනාවල ඇතුළත් පියා සහ දූදරුවන් අතර සම්බන්ධතාවයේ ස්වරූප අවධානයට ලක් කෙරිණි. ඒ සඳහා සමාජීය සාහිත්‍ය අධ්‍යයන න්‍යාය, ස්ත්‍රී- පුරුෂ සමාජ භාවීය න්‍යාය, පශ්චාත් යටත් විජිත සාහිත්‍යයික න්‍යාය යොදා ගැනිණි. ගීතය නම් කලාංගයේ සාහිත්‍යය අරමුණු ඉටු කරමින් පිතෘ භූමිකාවෙහි තථ්‍ය යථාර්ථය ප්‍රතිනිර්මාණය කරන්නේ කෙසේ ද? යන්න මෙහිදී විමසීමට ලක් විය.

ජනප්‍රිය කලාංගයක් ලෙස වර්තමානයේ ඇගයුමට ලක් වන ගීතය ගුණාත්මක බව පිළිබඳ ගැටලුවලට මුහුණ දෙයි. එබඳු පසුබිමක සීමිත කලා මාධ්‍යයක් වන ගීතය තුළින් පුළුල් සහ සංකීර්ණ ජීවන දෘෂ්ටීන් ඇතුළත් පවුල පිළිබඳ ප්‍රමාණවත් විග්‍රහයක් කළ හැකි ද? ගීතය, එකී කුටුම්භයේ සාකල්‍යවාදී හරස්කඩක් සීමිත ව ගෙන එන්නේ තථ්‍ය යථාර්ථයේ ඔප දැමූ සංකල්පනා සමුච්චයක් ලෙසින් ද? (අමරකීර්ති, 2017) යන බොහෝ දෙනා විසින් නගනු ලබන පැනය විමර්ශනය මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණ යි. නූතන ලෝකයේ උපකරණීය සබඳතා ගොඩනගා ගැනීමෙන් (අමරකීර්ති, 2017) න්‍යෂ්ටික පවුල් සංස්ථාවේ පිතෘ භූමිකාවෙහි විවිධ පරාස නිරූපණය කර ඇත්තේ කෙසේ ද? යන්න පර්යේෂණයේ දී අවධානයට ලක් කරයි.

## 2. පර්යේෂණ ක්ෂේත්‍රයේ පසුබිම හා සන්දර්භය

චතුර්වේදයේ සෝම යාගයේ දී ගීතිකා විශේෂයක් ගායනා කළ බව සටහන් වීම ද, බුදුහිමි සෞන්දර්යාත්මක ගීතය අගය කළ බව දීඝ නිකායේ සක්කපඤ්හ සූත්‍රයේ ඇති සඳහන් කර තිබීම ද ගීතයට දිගු ඉතිහාසයක් උරුම වූ බවට සාක්ෂ්‍ය වෙයි (රත්නායක, 2017:11). සිංහල සාහිත්‍ය තුළ ගී විරිත නමින් සන්දේශ වැනි පද්‍ය කාව්‍යන්හි භාවිත කළ විරිතක් ද, සිංදු නමින් සිංහල දෙමළ නාඩගම් සහ ප්‍රශස්ති සහ විරුදවල අන්තර්ගත ගායනා විශේෂයක් පිළිබඳ ව ද සඳහන් වෙයි (මනම්පේරි,

2017). නූතන සාහිත්‍යාංගයක් ලෙස ජනප්‍රියත්වයට පත් වී ඇති සිංහල ගීතයේ අවශිෂ්ට වී ඇති පුරාණ ම සාධකය ලෙස සීගිරි ගී සැලකෙයි. ක්‍රමික විකාශනයක් සටහන් කර ඇති ගීතය විවිධ පර්යාය නම්වලින් නූතනයේ හැඳින්වෙයි. සිංහල භාෂාවේ 'ගී, ගීත, සිංදු' ලෙස ද, පාලි භාෂාවේ 'ගීත' නමින් ද, සංස්කෘත භාෂාවේ 'ගීත, ගාන, ගීති, ගේය, ගාන්ධර්ව' නමින් ද, දෙමළ භාෂාවේ 'පාට්ටු (பாட்டு), පාඩල් (பாடல்) නමින් ද, ඉංග්‍රීසි භාෂාවේ 'සෝං (song)' යන නමින් ද ගීතය හැඳින්වෙයි (ආරියරත්න, 2018).

සමාජයේ තැනුම් ඒකකය ලෙස සැලකෙන පවුල, බහුතරයක් ගී පද රචකයින් තමන්ගේ සාහිත්‍යමය විඥානයේ පදනම ලෙස විග්‍රහ කරයි. මවගේ ගායනය, පියාගේ සාහිත්‍යය රුචිය, වැඩිමහල් සොයුරන්ගේ මග පෙන්වීම් ගීත රචකයින් වන්නට තමන්ට හේතු වූ බව බොහෝ අවස්ථාවල ඔවුන් විසින් ම විග්‍රහ කරනු ලැබ ඇත. රත්න ශ්‍රී විජේසිංහ තම කෘති බහුතරයක පිදුම පවුලේ ඥාතීන් වෙනුවෙන් වෙන් කර තිබීම ද, සුනිල් සරත් පෙරේරා තම මවගේ ජන ගායනා ඇසුරින් කලාව වෙත නැඹුරු වීම කෙරෙහි සිදු කළ බලපෑම ප්‍රමුඛ ලෙස සැලකීම ද, යමුනා මාලනී පෙරේරා ගීත රචිකාවක බවට පත් වීමට සහ ප්‍රවීණත්වයට පත් වීම තෙක් ඇයව මෙහෙය වීමට කුටුම්භයේ පැවති පසුබිම ඇය අගය කර තිබීම ද එයට ප්‍රබල සාධකයන් ය. පිතෘ භූමිකාව ගීතයට නැගෙන්නේ ඉතා ම අල්පව ය. පිතෘත්වයේ හෘදයංගම බව ගීතයේ වස්තු විෂයක් වී භාවාත්මක සහ අර්ථාන්විත ගී පද රචනා ලෙස ප්‍රතිනිර්මාණය වී ඇති අවස්ථා මෙම පද රචකයන්ගේ නිර්මාණවල සම්මුඛ වෙයි.

නූතන කාර්ය බහුල සමාජ යාන්ත්‍රණයේ නියුතු පුද්ගලයාට සාහිත්‍ය කලා රස විඳීම සඳහා අවශ්‍ය කාලය, නිදහස් මනස සහ විවේකී පරිසරය උපයා ගැනීමට අපහසු සාධකයන් බවට පත් වී තිබේ. එනිසා කෙටි කාල පරාසයකට කැටි වන, සරලාර්ථ සමන්විත ගීතය, වඩාත් ජනප්‍රියත්වයට පත් වී තිබේ. නූතනයේ මාධ්‍යයෙහි වඩා වැඩි ගුවන් කාලයක් අත්කරගෙන ඇත්තේ ද ගීතය යි. ගමනාගමනයේ දී, කාර්යාලයේ දී රසිකයා වෙත රසවින්දනය සමීප කරන ජනප්‍රිය සංස්කෘතියක් ගීතය

මගින් නිර්මාණය කර ඇතග පියා සහ දරුවන් අතර සම්බන්ධතාවයෙහි ගැඹුරු ආධ්‍යාත්මය නිරාවරණය කිරීම අභිභවා ජනප්‍රියත්වය අරමුණු කර ගත් භාවාත්මක පද රචනයක් නිර්මාණයට පද රචකයා උත්සාහ කරයිග ගීතයේ ජනප්‍රියත්වය වාණිජ පරමාර්ථ වෙනුවෙන් භාවිත කිරීමෙන් ගුණාත්මක බව ඌණනය වී ඇත.

සිංහල ගී පද රචනය හැත්තෑව දශකයේ සමාජ, ආර්ථික විපරිවර්තන මත සුසංවාදී සමාජයක් උදෙසා යථාර්ථවාදී ව අනුභූති ප්‍රතිනිර්මාණයට සුබනම්‍ය පරිදි සකස් වියග එම ගීතය අද්‍යතන සමාජ පරිවර්තන සමග විකාසනය වී නව්‍යාකාරයෙන් ප්‍රතිස්ථාපිත වී ඇති ආකාරය කෙතරම් සාර්ථක ද? යන්න මෙහි දී අවධානයට ලක් කරයි.

3. **පර්යේෂණ ගැටලුව**

ගීතය නමැති සාහිත්‍යාංගය මගින් ලාංකේය පවුල් සංස්ථාවේ පිතෘ භූමිකාවේ යථාර්ථය නිරූපණය කෙරේද?

ගීතය සංක්ෂිප්ත කලා මාධ්‍යයකි. මානව ආධ්‍යාත්මය නිරූපණයෙහි ලා ගීතයට භාෂාත්මක වශයෙන් ද, අවකාශමය වශයෙන් ද ඇත්තේ සීමිත ඉඩ ප්‍රස්ථාවකි. එය සඵලදායී ව යොදා ගනිමින් ගීතයේ පද රචනාව මගින් පිය පදවිය සමග බැඳෙන සංකීර්ණ යථාර්ථය නිරූපණය වන්නේ ද? යන්න අතීතයේ මෙන් ම නූතනයේ බිහිවන සාධනීය අර්ථ සහිත සුභාවිත ගීත මගින් විමර්ශනය කරයි. සාහිත්‍ය නිර්මාණයක් අවබෝධ කර ගැනීමේ සහ වින්දනය කිරීමේ හැකියාව සහ ස්වරූපය රසිකයාගෙන් රසිකයාට වෙනස් වන්නකි. අර්ථමය ගැඹුරක් සහිත ගීතය පොදු ජනයාට තේරුම් කර දීම උදෙසා වෙනම විචාරයක් අවශ්‍ය වන අවස්ථා ද පවතියි. එය ගීතය පිළබඳ ඇතැමුන්ගේ විවේචනයට ලක් වන්නකි. ජනප්‍රියත්වය ඉලක්ක කර ගත් වර්තමාන ගීත පද රචනා අර්ථය පිළිබඳ නොතකා සිදු කරන වචන යෙදීම් වශයෙන් පමණක් අර්ථකථනය කළ හැකි විවේචනයට ලක් වෙයි.

**4. පර්යේෂණයේ අරමුණ සහ අධ්‍යයනයේ වැදගත්කම**

ගීතයේ භාෂාත්මක සහ සාහිත්‍යමය අගය පිළිබඳ වඩාත් සාකච්ඡාවට බඳුන් වන විවේචන සහිත ආන්දෝලනාත්මක යුගයක් ලෙස මෙම අවධිය සැලකිය හැකි ය. පිතෘ භූමිකාව පිළිබඳ රචනා වූ ගීත, ගීත සාහිත්‍යයේ එක් අංශයක් පමණක් වුව ද එය සමාජ හැඩගැස්වීමෙහි ලා සිදු කරන කාර්යභාරය පෘථුල ය. දුරස් වන මානව සබඳතා මත හෝ ගැටුම්වලට මානුෂීය අර්ථකථනයක් සපයන්නට ගී පද රචනා සමත් වන බව ප්‍රකට කළ සාහිත්‍යය බොහෝ ය. ගීතයේ විවිධ පරාස පිළිබඳ අධ්‍යයන මේ වන විට සිදු කර තිබුණ ද, ගී පද රචනයේ සාහිත්‍යය මගින් පිතෘ භූමිකාවේ යථාර්ථ නිරූපණය පිළිබඳ විවිධ මතවාදීමය විචාර හැරුණු විට සමාජ විද්‍යාත්මක කරුණු පදනම් කරගත් ප්‍රමාණාත්මක අධ්‍යයන සිදු වී නොමැති හෙයින් ද, ගීත සාහිත්‍යයේ සංවිධිත බව කෙරෙහි යොමු කරන අවධානය සාධනීය මට්ටමක පවත්වා ගැනීමෙහි ලා හුදෙක් විවේචනයට සීමා නොවී ගී පද රචනය කෙරෙහි බලපා ඇති සමාජ ආර්ථික දේශපාලන කරුණු පිළිබඳ අධ්‍යයන අධ්‍යාශය ඇති විය.

සුනිල් ආරියරත්න, මඩවල එස්. රත්නායක වැන්නන් සිදු කරන ලද පර්යේෂණ ඔස්සේ අනාවරණය වී ඇති පරිදි ගීතයේ මුල් කාලයේ හින්දි ගී තනුවලට සිංහල ගීත රචනා කර ගායනා කිරීම හේතුවෙන් සාහිත්‍යමය අගය ද්විතියික තත්ත්වයට පත් වී තිබේ. නූතනයේ ද විවිධ සංගීත රචනා සඳහා ගීත නිර්මාණය කෙරෙහි අනුකාරක වශයෙන් යොමු වීමෙන් සාහිත්‍යමය අගය අභියෝගයට ලක් වී ඇත. නව්‍ය සංකල්පනා නිර්මාණය, භාෂාත්මක සුගායනීය බව වෙනුවෙන් භාෂාව නිදහසේ හැසිරවීමට එය අභියෝගයක් වෙයි. මේ හේතුවෙන් ගී පද රචනයේ භාෂාත්මක නිර්මාණශීලීත්වය සහ සංයමය පිළිබඳ අවශ්‍යතාව නව පරපුර තුළ ද තෘතීයික ගණයේ අවශ්‍යතා බවට පත් වී තිබේ. සාහිත්‍ය නිර්මාණයක් වශයෙන් ගී පද රචනය අවශේෂ ශානරයන්ට වඩා සංක්ෂිප්ත හෙයින් ද, අවර ගණය ලෙස නූතනයේ වඩාත් අවගාමී තත්ත්වයට පත් වී ඇති හුදෙක් රසවින්දනය හෝ නිසි පරිදි සම්පාදනය නොකරන ගීතය සාහිත්‍යය භාෂාවට කරන බලපෑම ද සුළුපටු නො වේ.

එහෙයින් එම තත්ත්වය සංසන්දනාත්මක ව විමර්ශනය කරමින් සාපේක්ෂ ව සාධනීය භාෂා භාවිතයකට අවශ්‍ය කාරණා ඉස්මතු කිරීම උදෙසා මෙම පර්යේෂණය දිශාගත වෙයි.

යථෝක්ත තත්ත්වයන් මගින් පසක් වන්නේ සෑම සාහිත්‍ය කලාංගයක ම අර්බුද අවස්ථාවල දී පමණක් ඉස්මතු වන නියාමනය යන සංකල්පය නෛතික ව ප්‍රායෝගිකකරණය නොවන පසුබිමක ගීත රචනා කලාව විනාශ නොවී රැක ගැනීම උදෙසා නව පරපුරේ ගීත රචකයින් තුළ ස්වයං නියාමනයක් හෝ අවශ්‍ය බව යි. මෙහි දී විමර්ශනයට ලක් කරන ගී පද රචකයින් තිදෙනා සිංහල ගීතයේ දියුණු ම අවධිය ලෙස සලකන 70-80 දශකවල දී ක්ෂේත්‍රයට පිවිසි එවකට සිටි ප්‍රාමාණිකයන් ඇසුරෙහි ඥානමය සහ අනුභූතිමය ප්‍රාගුණ්‍යය ලැබූ, සාහිත්‍යමය කියවීමක් සහිත බව සමාජය ඉදිරියේ ප්‍රකට කළ අය වෙති. ඔවුන්ගෙන් රසවින්දන පරාසය ආවරණය කළ නිර්මාණ බිහි වී ඇති හෙයින් ද, ඔවුන් ඇසුරින් ගී පද රචනා කලාව, ජීවිතය, ශික්ෂණය, මනා සාහිත්‍ය පරිශීලනය සහ දැක්මක් ඇති ව ගී පද රචකයා පුහුණු විය යුතු බව අවධානයට ලක් කිරීම ද පර්යේෂණාභිමුඛ ය.

නූතන සිංහල සාහිත්‍යය විෂය ක්ෂේත්‍රයට අදාළ වඩාත් ජනප්‍රිය සාහිත්‍යාංගය වන ගීතයේ විවිධ ශානර පර්යේෂණයට ලක් වී ඇති අතර ගීතයෙන් නිරූපිත පවුල් සංස්ථාවේ පිතෘ භූමිකාව පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයන මෙතෙක් සිදු වී නොමැත. එම රික්තය යම්තාක් දුරකට හෝ ඌන පූරණය කරමින් ඒ පිළිබඳ සාහිත්‍යයක් ගොඩ නැගීමට උපස්ථම්භක වීම මෙහි අරමුණකි. මේ සඳහා විවිධ විෂයීක පරාස අධ්‍යයනයේ දී පර්යේෂණය දියත් විය යුතු ක්ෂේත්‍ර, මෙතෙක් පර්යේෂණයට ලක් නොවූ අංශ හඳුනාගත හැකි විය. සෞන්දර්යාත්මක නිර්මාණයක් ලෙස ගීතයේ ශිල්පීය අගනාකම් සුරක්ෂිත කරන නව පර්යේෂණ ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරවීමත්, තරගකාරී සමාජ ක්‍රමය තුළ ගුණාත්මක බව සහිත ආකර්ෂණීය නිර්මාණ සිදු කිරීම උදෙසා නව මානයන් ඇති කරගැනීමේ අවශ්‍යතාව පෙන්වාදීමත්, එබඳු ගුණාත්මක නිර්මාණ රසවිඳීම

පිළිබඳ සමාජයේ තරමක හෝ සාවධාන වීමක්, කථිකාවක් නිර්මාණය කිරීම මෙහි අරමුණ යි. මෙම අධ්‍යයනය නව පර්යේෂණ දිශානතීන් වෙත යොමු වීම උදෙසා පිටිවහලක් ද වනු ඇතැයි අපේක්ෂාව යි.

## 5. පර්යේෂණ ක්‍රමවේදය

### 5.1 අධ්‍යයන විධික්‍රම සහ දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය

ගී පද රචනා ප්‍රමාණය සංඛ්‍යාත්මක ව ඉහළ අගයක් වන හෙයින් ද, මෙරට න්‍යෂ්ටික පවුල් සංකල්පය සමාජගත කිරීමට බලපෑ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ද, විශ්ව සාහිත්‍ය පරිශීලනය සමග යථාර්ථවාදී කලාවක් වෙත මෙරට අවධානය යොමු වූ අවධිය හෙයින් ද 70 දශකයේ සිට වර්තමානය දක්වා ගීත රචකයින් ලෙස කලාවේ නියුතු සුනිල් සරත් පෙරේරා, රත්න ශ්‍රී විජේසිංහ, යමුනා මාලනී පෙරේරා යන ගීත රචකයින්ගේ තෝරා ගත් ගීත සංග්‍රහ ඇසුරින් අධ්‍යයනය සිදු කිරීමට නියමිත ය. ප්‍රමාණාත්මක ව පවුල පිළිබඳ තේමා අනුභූති වශයෙන් යොදා ගැනීම වැඩි ම ගීත රචකයින් ලෙස මොවුන් තෝරා ගැනිණ. දශක පහක පමණ කාල සීමාවක් අධ්‍යයනයට නතු වන අතර, මෙම ගීත රචකයින් එම අවධීන්හි සිදු වූ සමාජ වෙනස්වීම් ගීතයට යොදාගත් ආකාරය සමාජ විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීමෙන් ගුණාත්මක අධ්‍යයනය මෙහි පර්යේෂණ ක්‍රමවේදය වෙයි. සමාජීය සාහිත්‍ය අධ්‍යයන න්‍යාය, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවීය න්‍යාය, පශ්චාත් යටත් විජිත සාහිත්‍යයික න්‍යාය පදනම් කර ගනිමින්, සමාජයේ සමාජ විද්‍යාත්මක පරිවර්තන සහ ඒවායේ සමාජමය ප්‍රතිඵල වින්දනය මෙන් ම අධ්‍යයනය ගී පද රචනාවකන් නිරූපණය වන්නේ කෙසේ ද? යන්න අධ්‍යයනය මෙහි දී සිදු විය. ලේඛන මූලාශ්‍රය අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා, දුරකථන සංවාද දත්ත රැස් කිරීමේ විධික්‍රම වශයෙන් යොදා ගැනිණි.

## 6. සාකච්ඡාව

සංස්කෘතික නියමය අනුව පවුල් සංස්ථාවට ආරක්ෂාව සැලසීම පියාගේ කාර්යය යි. එනම්, පුරුෂයා රැකියාවක නිරත වීම සහ මුදල් ඉපයීම කළ යුතු යැයි පිළිගැනීම යි. "පිය සෙනෙහසට කවි ගී ලියවුණා මදී" සිංහල

සාහිත්‍යයේ මාතෘත්වයේ ගුණ පිළිබඳ විරචිත ගීත පද සංඛ්‍යාවට සාපේක්ෂ ව පිය ගුණ ගීත ලිය වී ඇත්තේ අඩු ප්‍රමාණයකි. මනෝවිද්‍යාත්මක තත්ත්ව, වගකීමේ ස්වරූපය සහ වෘත්තිය ආදිය පියාගේ ආදරය ප්‍රදර්ශනාත්මක බවින් අඩු වීමට හේතු වී තිබේ. එහෙත්, දරුවන් සහ පියා අතර පවතින මනෝවිද්‍යාත්මක බන්ධුත්වය සියුම් ය. ලිබරල් සමාජයේ මවක සේ ම පියාගේ භූමිකාව ද සංකීර්ණ වී තිබේ. දරුවන්ගේ ආරක්ෂාව, පෝෂණය සහ සෙනෙහස පිළිබඳ පියෙකුගේ වගකීම ප්‍රායෝගික වී ඇති ආකාරය ගීත රචකයින් නිරූපණය කර ඇති ආකාරය විවිධ ය. දරුවාගේ උපතේ දී ම මව මිය ගිය පසු ව තනිව දියණිය ඇති දැඩි කළ ද, යොවුන් වියේ දී ආරක්ෂා කර ගැනීමට නො හැකි වූ පියෙකුගේ පශ්චාත්තාපය "පුංචි සාවියේ" ගී පද රචනයේ ඇතුළත් ය.

චන්ද්‍ර මණ්ඩලේ සැතපුණු පුංචි සාවියේ
මන්ද කියාපන් නොකියා හැංගිලා ගියේ
පාන නිවුණ සේ පාළුයි ලැයිම් කාමරේ
මන්ද නුඹ ගියේ කියපන් පුංචි සාවියේ (විජේසිංහ, 1990)

රුසියානු කෙටිකතාකරුවකු වූ ඇලෙක්සැන්ඩර් පුෂ්කින්ගේ 'තානායම්කරුවා' කෙටිකතාව සහ සැබෑ සමාජ අනුභූතියක් පාදක කර ගනිමින් ගීතය නිර්මාණය කර තිබේ. පියෙකුගේ සෙනෙහස පිළිබඳ එක් පැතිකඩකින් විද්‍යමාන කිරීමට දැරූ ප්‍රෝත්සාහයකි. පියාට දියණිය වෙනුවෙන් සුඛෝපභෝගී ජීවිතයක් ලබා දිය නො හැකි වුව ද, පරිත්‍යාග කළ උණුසුම, රැකවරණය චන්ද්‍ර මණ්ඩලයේ සෞම්‍යත්වයෙන් යුතු ය. එහෙත්, දියණිය භාවාශක්ත ව ප්‍රෝඩාවට මුළා වී ඇත. ඇය "පාන නිවුණ සේ පාළුයි ලැයිම් කාමරේ" යි පියාගේ ජීවිතයේ ද පහන විය. ආර්ථික, සමාජ අභියෝගවලින් පීඩිත වූ පියාට ජීවත් වීමට අපේක්ෂාව වූ ඇගේ ජීවිතය අනාරක්ෂිත විය. දියණියගේ අපාලිත නික්ම යාමෙන් පසුව ද "පුංචි සාවියේ" යන දයාර්ද්‍ර, ආමන්ත්‍රණයෙන් පිතෘ ස්නේහය ප්‍රකාශ කරයි. වරදක් කළ ද 'මගේ දරුවා' යන ස්නේහධාරීත්වය සතු වන්නේ පියෙකුට ය. මවකට මෙන් ම පියෙකුට දරුවෙකුගේ වරද ඉදිරියේ සමාව ලබා දීමේ දාරක ප්‍රේමය ගී පදවලින් ඉස්මතු වෙයි.

සමාජය සංකීර්ණ වීමේ ප්‍රතිඵලයක් ලෙස ම බැහැර කළ නො හැකි උක්ත සංසිද්ධිය නූතන සමාජයේ සුලබ බේදවාචකයක් බවට පත් වී අවසන් ය. දරුවන් ස්වකීය අභිමතය පරිදි අදූරදර්ශී වන අවස්ථා තිබේ. දියණියකගේ අවශ්‍යතා හෝ චර්යාත්මක විශේෂතා පිළිබඳ තීක්ෂණ විමර්ශනයක් සිදු කිරීමට පියා යුහුසුලු නො වී ඇත්තේ තම දියණිය පිළිබඳ පැවති විශ්වාසය හේතුවෙන් බව හැඟී යයි. එහෙත් සමාජයේ අනාරක්ෂිත බව හෝ දියණියගේ කායික මානසික වෙනස් වීම, ජීවන අර්බුදයේ නිරත පියාගේ සංජානනයට ලක් වන විට ප්‍රමාද වී තිබිණි. පිතෘ ස්නේහයේ උපරිමය නිරූපණය වන පරිදි රත්න ශ්‍රී විජේසිංහ ගීතයෙන් නිරූපණය කරයි. පියෙකුට සිය දියණිය සුරක්ෂා කිරීමට අද්‍යතන යුගයේ අවධානය යොමු කිරීම ද දුෂ්කර ය. පුද්ගලබද්ධ ශක්‍යතාවක් වන බහුකාර්යතාව පුරුෂයෙකුට සාපේක්ෂ ව ස්ත්‍රියක සතු බව මනෝවිද්‍යාත්මක තත්ත්වයකි.

මාල බැඳන් සුදු යකඩෙන් රෝස මල් වනේ
මාල ගිරව් ගේ දොරකඩ සිංදු කිව් වෙලේ
හීනෙනුත් හිතුණෙ නෑ මට මොකද කාරණේ
පාර මතක නං තාමත් ගේ ළඟයි දුවේ

(විජේසිංහ, 1990: 22)

පියාගේ දෘඪ බව දරුවෙකුගේ ආරක්ෂාව වෙනුවෙන් පවත්වා ගනි යි. එහෙත්, කිසියම් විපතක් සිදු වූ විට මෘදු ව තීරණ ගනි යි. නගරයේ නො මනා චර්යා සහිත තරුණයෙකු සමග දියණිය අතුරුදන් වී ඇත. පියා ඇයට යළි පැමිණෙන ලෙස ආරාධනා කරයි. පුද්ගල චරිත විවිධ ය. පුද්ගල මානසිකත්ව විවිධ ය. මාල බැඳීම, සිංදු කීම, අවිචාරවත් හැසිරීම් රටා තාරුණ්‍යයේ ඇතැම් පාර්ශ්ව සිය ජනප්‍රියතාව, ආකර්ෂණය උදෙසා යොදා ගන්නා ක්‍රමවේද ය. ජෛව රසායන ක්‍රියාවලි සමග පුද්ගලයා තුළ ඇති වන නොයෙක් භාවමය උද්දීපන චර්යාමය තත්ත්වවලට හේතු වෙයි. තමන්ගේ නිවස ඉදිරියේ සංසරණය වූ තරුණයෝ ද ශිෂ්ට සමාජයක් විසින් ප්‍රතික්ෂේප කරන ලක්ෂණ සහිත චර්යා දැරූ හ. තම දියණිය පිළිබඳ පියා සතු වූ විශ්වාසය තරුණයින්ගේ හැසිරීම දියණිය කෙරෙහි

සැකයෙන් බැලීමට හේතුවක් නො වී ය. " හීනෙනුත් හිතුනෙ නෑ මට මොකද කාරණේ" සෑම මවකට ම, පියෙකුට ම තම දරුවා, දුවක වුව ද පුතෙකු වුව ද කෙතරම් වියපත් වුව ද දරුවෙක් ම ය. පියාට දියණියගේ වෙනස්වීම් නො පෙනීමට පිතෘ ස්නේහය ද හේතුවක් බව විද්‍යමාන ය.

පුරුෂයෙකු සමග පැන ගිය පසු තරුණියකගේ වටිනාකම පිරිහුණු ලෙස සලකන සමාජය ඇයගේ අනවබෝධය නො තකයි. සිංහල සමාජයේ තරුණියකගේ පවිත්‍රතාව පිළිබඳ ආකල්පය විග්‍රහ කරන මාග්‍රට් මීඩ් අපට තරම් ස්වාමි පුරුෂයෙකු දක්නා තුරු පරපුරුෂයකු නො දනිම් හ. දෙමව්පියන් විසින් දීග දෙන තුරු සෑම ස්ත්‍රියක ම කන්‍යාවක ව සිටිය යුතු ය (ආරියපාල, 2014:298). ඇයට නිසි මග පෙන්වා දීමට ක්‍රියා නො කරයි. කෙසේවෙතත් එවන් තත්වයකට පත් වූ පසු ඇය ව භාර ගැනීමට අයෙකු නො මැත. එම තරුණිය පමණක් ම නො ව ඇයගේ පවුලේ සාමාජිකයින් සහ හිතමිතුරන් දෙස පවා සමාජයෙන් ලැබෙනුයේ යහපත් ප්‍රතිචාරයක් නො වේ. රචකයා දක්වන පියාගේ සෙනෙහස කොතෙක් ද යත් තමන් ව පවා නො සලකා බැහැරට ගිය දියණිය යළි භාර ගැනීමට ඔහු නො පැකිළ ව ඉදිරිපත් වන්නේ ආත්ම ගරුත්වය, ආත්මාභිමානයට වඩා තම දියණිය ඔහුට අනර්ඝ හෙයිනි. "පාර මතක නං තාමත් ගේ ළඟයි දුවේ" යන ප්‍රකාශය ගීතයේ පියෙකුගේ දාරක සෙනෙහස දැක්වෙන සංවේදී වචන ඛණ්ඩය ලෙස දැක්විය හැකි ය.

නූතන සමාජ රටාවත් සමග මව-පියා දෙදෙනාගෙන් එක් අයෙකුට තනි ව දරුවෙකු ඇතිදැඩි කර ගැනීමට සිදු වීම නිසැක ව ම අභියෝගයකි. ජීවන අවශ්‍යතා ඉටු කරමින් තම කාර්යයන් සිදු කර ගැනීමට ද, දරුවා ආරක්ෂා කර ගැනීම ද තීරණාත්මක ය. දරුවා කෙරෙහි සමාජය පොදු මානව භක්තියෙන් සලකන්නේ නම් අනාගතය පිළිබඳ දූරදර්ශී චින්තනයක් දරන්නේ නම් දරුවන්ගේ අනාරක්ෂිත බව පිළිබඳ මෙතරම් ඛේදනීයත්වයකට රට පත් නො වනු ඇත. තරුණියක ලෙස හෝ නව යෞවනත්වයේ සිටින දියණියක ලෙස තමන් තමන්ට පමණක් අයත් නො වන බවත් සමාජයේ ප්‍රබල වගකීමක් තමන් සතු බවත් ගීතය අවධාරණය කරයි. අනාරක්ෂිත වූ දැරිය දඬුවම් කර සමාජයට මුදා හැරීම,

ඇය ව අසැබි චර්යාවලට යොමු කරන්නට හේතුවකි. අනවබෝධයෙන් සිදු කරන ලද වරදට පියාගේ සමාව හිමි කර දීම විශ්වීය අරමුණක තබන ලද්දකි. අද්‍යතන සමාජයේ සංස්කෘතික සීමා සහ සමාජ පෙළඹවීම් හේතුවෙන් ජීවිත අනාරක්ෂිත වන දරුවන් සුලබ ය. පියෙකු වශයෙන් ක්ෂණික ව මෙවන් තීරණයකට එළඹීම සෑම පියෙකුගෙන් ම අපේක්ෂා කළ නො හැකි ය. එහෙත්, පසු ව හෝ දරුවන්ට සමාව භජනය කරන අවස්ථා තිබේ.

වත්මන් සමාජයට සාපේක්ෂ ව ලිබරල්වාදයේ ප්‍රාරම්භක අවධියේ පියා දෛනික පැවැත්මට සරිලන වේතනයක් බලාපොරොත්තු විය. එහෙත්, නූතන වැඩ ලෝකයට අවතීර්ණ වූ මිනිසා වටා ගොඩ නැගී ඇත්තේ ඉතාමත් සංකීර්ණ සමාජ පරිසරයකි. දියුණුව සංකල්පීයමය වශයෙන් ආත්මාර්ථකාමීත්වයෙහි පුද්ගලයා සිර කර තබන්නකි. පියෙකුට නූතන පරපුරේ සමාජ අවශ්‍යතාවල ස්වරූපය දක්වමින් සිදු කරන ඉල්ලීමක් ගීතයේ වස්තු විෂය ලෙස යොදා ගෙන තිබේ.

ආගම, ධර්මය මගින් උගන්වන පාරිශුද්ධ මිනිසුන් බිහි වීම ධනේශ්වරය විසින් ආවරණය කර තිබේ. බොහොමයක් පුද්ගලයන් පෘථග්ජන සමාජය සමග ගැටී දෘඪ ජීවන යථාර්ථය වටහා ගත්තවුන් ය. එකිනෙකාට තම තමන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් දුෂ්කර පිළිවෙත් අනුගමනය කිරීමට සිදු වෙයි. ඇතැමෙක් සරල ජීවන ශෛලියක් ගත කරමින් සීමිත ජීවන අපේක්ෂා සහිත ව ජීවත් වෙති. ලාංකිකයා ධනවාදී ආර්ථික රටාවේ ගොදුරක් වීමෙන් සරල ජීවන ශෛලිය අහිමි සංකීර්ණ අර්බුදකාරී ජීවනයක ගොදුරක් විය. "විවරණය දෙනු මැන" යන තේමාවෙන් රචිත ගීතයෙන් පෙදරේරු පියෙකුගේ ජීවන යථාර්ථය නූතන ධනේශ්වර සමාජයේ ජීවන ශෛලිය සමග සසඳමින් දක්වයි.

අහසේ පලක් බැඳ
යමා මහ පෙළහර පාන්නේ
පලංචියට නැග
හුණු බදාම ගෙන
කාගෙ ගෙයද ගොඩනගන්නේ (පෙරේරා, 1995)

ලෞකික ලෝකයට වඩා ආධ්‍යාත්මික ලෝකය කෙරෙහි සැලකිල්ලක්

දැක්වීම බෞද්ධ සමාජයේ ස්වභාවය යි. පාරලෞකික ශුභවාදී දෘෂ්ටියෙන් යුතු ව පරාර්ථය කෙරෙහි යොමු වීම චර්යාත්මක ව ගැමි ජීවනයේ සුලබ චර්යා ධර්මයකි. අද්‍යතන මිනිසා ජීවත් වනවා නො ව, ජීවන අරගලයක නිරත වෙයි. ඔහු පිළිවෙත් පුරන්නේ වුව ද, එහි මෙලොව වශයෙන් සිදු වන ලාභ- අලාභ ගණනය කිරීමට සිදු වී ඇත. සංකීර්ණ ජීවිතය පුද්ගල ජීවන ලාලසාව ගොඩ නගන්නේ ම පරිභෝජනවාදය මත ය. එහෙයින් තරගකාරීත්වය මත සියල්ල තීරණය කිරීමට සිදු වෙයි. නිශ්චිත මිනුම් ඒකකයක් භාවිත නො කළ ද පුද්ගලයාට සමාජ සේවය ද මිනුම්ගත කිරීමට සිදු වීම අභාග්‍යයකි. එය නූතන සමාජයේ යථාර්ථය හෙයින් බැහැර කළ ද නො හැකි සත්‍යයකි.

සරල සමාජයේ මිනිසා තම ශක්තිය උපරිමයෙන් තවකෙකු වෙනුවෙන් කැප කිරීම් කිරීම අභිමානයක් කොට සැලකී ය. රචිකාව දියණියක වශයෙන් පලංචියට නැග ගත් පියා සිය ශක්තියේ උපරිමයෙන් නිවසක් ගොඩනගන්නේ "යමා මහ පෙළහර පාන්නාක් මෙනි' යි දක්වයි. රචිකාව වාසය කරන සමාජයේ යථාර්ථය අනුව තමාගේ ශක්තියේ උපරිමය යොදා ගොඩ නගන්නේ කාගේ ගෙයදැ' යි විමසන්නට සිදු වෙයි. පියාගේ යුගය අතික්‍රමණය කළ යුගයක තම අරමුණු රෝපණය කිරීමට ඇයට සිදු වී ඇත. ස්ත්‍රී කාරකත්වය ගීතයට උපයෝගී කරගන්නා යමුනා මාලිනී පෙරේරා සමාජ යථාර්ථයේ යුග විපරිවර්තනයේ සංධිස්ථානයක අද්දැකීම් සහිත රචිකාවකි. ඇයගේ ජීවනානුභූති පියා ඇසුරෙන් පූර්වජයින් සියල්ල විචක්ෂණශීලී විචාරයට ලක් කරයි.

පලංචියේ අත් උදව්ව වන්නෙමි
නුඹේ ඇවෑමෙන් හෙට රජ වන්නෙමි
ඒත් අනුන්ට ම මාලිග හදලා
රජ වී මොකට ද අප්පච්චී (පෙරේරා, 1995)

කථිකාව පියාට එරෙහි නො වෙයි. පියාගේ යුගයේ අරමුණු සමග නූතන යුගය සට්ටනය කරයි. පූර්ව මානව චර්යා ඔස්සේ නූතන යුගයේ අභිප්‍රේතාර්ථ සාධනය කර නො ගත හැකි ය, යන අවබෝධය ඇය සතු ය. පියා ගත කරන සරල ජීවිතය වෙනුවට, "නුඹේ ඇවෑමෙන් හෙට රජ

වන්නෙමි" යන සංකීර්ණ අවශ්‍යතා ජාලයක් ඇයට පවති යි. පියාගේ පරපුරෙහි උරුමයෙන් ඒවා ඵලාප්තියක් සිදු කර ගැනීම දුෂ්කර ය. සමාජ විප්ලවයේ පරිණාමීය වෙනස්කම් මානව ශිෂ්ටාචාරයේ විපරිණාමීය තත්ව රාශියක් නිර්මාණය කර අවසන් ය. පියාගේ පරාර්ථකාමී සමාජ සේවාව "අනුන්ට ම මාලිග හදලා- රජ වී මොකට ද අප්පච්චී" යැයි ප්‍රශ්න කරන දරු පරපුරක් නිර්මාණය වී ඇත්තේ ධනේශ්වරයේ පීඩාවෙනි. නූතන සමාජ පරිස්ථිතියෙහි ඇගයුමට ලක් වන්නේ පොදු සංකල්පය නො ව පෞද්ගලිකත්වය යි. අනෙකා පීඩාවට පත් කරමින් ආත්මාර්ථ සාධනයට ම යොමු කරවයි.

පලංචියෙන් බැස අකුරට යන්නට
පැන පොතේ වැඩ අතර රැඳෙන්නට
නුඹට උරුම නැති විසල් ලෝකයක
සක්විති වෙන්නට මම ආසයි (පෙරේරා, 1995)

"පලංචියෙන් බැස අකුරට යන්නට" අවශ්‍ය වීම සමාජයේ සීමා අතික්‍රමණය කර යුග අවශ්‍යතා අනුව හැඩ ගැසෙන්නට සිදු වීමේ බලවත් අවශ්‍යතාව අවධාරණයට රචිකාව භාවිත කරන යෙදුමකි. අධ්‍යාපනය අනාගතය ගොඩ නැගීමේ මග වී තිබේ. උගත්කම- අධ්‍යාපනය සමාජ ඉලක්කය යි. තමා සිටින සමාජ තරාතිරම කවරක් වුව ද, දැනුම් සමාජය අධ්‍යාපනය මත ගොඩ නැගී තිබේ. අධ්‍යාපන ඉලක්ක සපුරා ගෙන හුදෙක් තාවකාලික සාක්ෂරතාව පමණක් අවශ්‍ය වූ සමාජයේ නො වූ සංකීර්ණ අරමුණු සමුදායක් අතර පැවතී ඇත. දෙමව්පියන්ට එම ලෝකය ස්පර්ශ නො විණි. දරුවන් රජුන් කිරීමට දෙමව්පියන් සිහින දකින්නේ වුව ද, රජ වීම සංකීර්ණ ක්‍රියාවලියක ඵලාප්තියකි. සරල සමාජ අවශ්‍යතා සංකීර්ණත්වයට පත් කර පරම්පරා ගැටුමක් තෙක් වර්ධනය කළ නව ලිබරල් ආකෘතියේ තීව්‍රතාව ගීතයෙන් ප්‍රකට කරන රචිකාවගේ සවිඥානිකත්වය ගීතයේ සාර්ථකත්වය සහ යුග තුල්‍යතාව සංකීර්ණ අර්ථපූර්ණත්වය වෙනුවෙන් උපකෘත ය. යථාර්ථ ප්‍රතිනිර්මාණයෙහි ලා යමුනා මාලිනී ගීත රචිකාව දැක්වූ සුවිශේෂ ශක්‍යතාව මෙම ගීතයෙන් නිරූපිත ය.

පියා සහ මව කුටුම්භයේ නිමැවුම්කරුවන් දෙදෙනා ය. එකිනෙකාට ස්වභාව ධර්මයා විසින් ම අනන්‍ය කරවූ ශක්‍යතා පවති යි. පවුලේ එක් සාමාජිකයෙකුගේ කාර්යයකට අනෙකා උපකාර කළ ද එකිනෙකාගේ කාර්යය ඇතැම් විට වෙනකෙකු විසින් සම්පූර්ණ කළ නො හැකි තරමට ම සංකීර්ණ ය. අනන්‍යය ය. මවකගේ කාර්යය සහ පියෙකුගේ කාර්යය ස්වභාව දෙකකි. දරුවා බිහි වන විට ම මව අහිමි වීම පියෙකුට තම දරුවා හදා වඩා ගැනීමට ප්‍රබල අභියෝගයක් වන්නේ ළදරුවාගේ කුස ගිනි නිවීම ද දැඩි අභියෝගයක් බවට පත් වීම හේතුවෙනි. ආදරය සුන්දර වරදකි කෘතියේ දී යමුනා මාලිනි පෙරේරා විසින් දරු ප්‍රසූතියේ දී ම මව මිය ගිය පසු පියා විසින් දරුවා ඇති දැඩි කරනු ලැබීම සහ අවසන දරුවා කුඩා අවධියේ දී ම සසුන් ගත වන සිදුවීමක් ආශ්‍රය කර ගත්තකි.

අම්මා බුදු වෙයි සැක නෑ
සම්මාදන් වී පිනට නුඹේ
නුඹ නැති  දා කිරි සුවඳේ
මට මොන පදවි ද පුතුනේ (පෙරේරා, 2000)

"අම්මා නැති අපට බඩගිනි වෙන්න එපා"'යි ජනකවියා පැවසුයේ අම්මා නො මැති නිවස හුදෙකලාව, සෙනෙහස, ශ්‍රියාව අහිමි වන බව හඟවමිනි. "අම්මා බුදු වෙයි සැක නෑ සම්මාදන් වී පිනට නුඹේ" යන පියාගේ හැඟීම, මව පූසුතියේ දී මිය ගිය ද දරුවා බිහි කිරීමේ පුණ්‍ය කර්මය සිදු කිරීම ම ඇයට බුදු බව ලැබීමට උපස්ථම්භක වන කුසලයක් බවයි. උපන් බිළිඳාට මව් කිරි ලබා දෙන්නට මවක් නොමැත. රචිකාව " නුඹ නැති දා කිරි සුවඳේ" යන යෙදුමෙන් අර්ථ ගන්වන්නේ ගීතාත්මක ව ය. අම්මා නොමැති නිවසේ පිය පදවි ලබන්නට සිදු වී ඇත්තේ පියාගේ තෙදවත්, ඔදවත් බව මතින් පමණක් නො වේ. මවගේ දයාර්ද්‍ර බව ද එහි කැටි කොට තිබිය යුතු ය. මව්- පිය පදවි යුග්මය ම පියාට දරන්නට සිදු වී තිබේ. එය ළදරුවෙකු සමග ගත කරන්නට සිදු වීම අතිශය සංකීර්ණ ය.

වෙනදා අකුරට යන්නට කම්මැලි වී
හඬා වැටුණු පුතු කම්බිලියට ගුලි වී
අද මා ඇහැරී දෙනෙත් හරිණා උදයේ

කසාවතක් පොරොවෙන් යයි හිමිදිරියේ (පෙරේරා, 2000)

පියා දරුවා වෙනුවෙන් හැකි පමණ දාරක සෙනෙහස ලබා දුන්නේ ය. අවශ්‍ය ආහාර පාන, උපකාර සිදු කළේ ය. එහෙත් ද දරුවෙකුට අවශ්‍ය සියලු අවශ්‍යතා හුදෙකලා පියෙකුට පූරණය කිරීම දුෂ්කර යථාර්ථයක් බව වටහා දෙන රචිකාව දරුවා සසුන්ගත කරවයි. උපන් දින සිට ම මාතෘ ස්නේහය අහිමි වීම, ජීවන කටුකත්වයට මුහුණ දීම අභියෝගයකි. ජීවිතයේ පරිණාමීය වෙනස පවුල් සංස්ථාවක බාධක හමුවේ කුමන දිශානතියක් ඔස්සේ ගමන් කරයි ද යන්න පිළිබඳ නිශ්චිත ව ම කිව නො හැකි ය. ගීතය ඒ බව විශද කරන්නේ නිවසේ පියාගේ උණුසුමෙහි සිටි, උදෑසන අවදි වීමට පවා මැළි වූ දරුවා කලකින් උදෑසන පිඬුසිඟා වැඩම කරවන සාමණේර හිමි චරිතයක් බවට පත් කරමිනි. අනන්‍ය වූ ශක්‍යතා ස්ත්‍රී- පුරුෂ දෙපාර්ශවය ම සතු හෙයින් ගෘහස්ථ කටයුතු මවක ලෙසින් ම සිදු කිරීමට පියාට නො හැකි ය. බිරිඳගේ වියෝව සහ වගකීම්වලින් පිරුණු ජීවිතය ද, දරුවා රැකබලා ගැනීම සහ වෘත්තිය ද යන නූතන සමාජ වගකීම් සියල්ල න්‍යෂ්ටික පවුලක පියෙකුට පැවරුණු විට නිසි පරිදි ම සියලු කර්තව්‍ය ඉටු නො වේ. පිතෘ භූමිකාව වෙනුවෙන් කැපවීම් කරයි.

ලෞකික ජීවිතයෙහි විවාහයක් සහ පවුලක අරමුණ වන්නේ දරුවන් හදා වඩා උස්මහත් කර උසස් සමාජ ජීවිතයක් උරුම කර දීම යි. එහෙත් ප්‍රස්තුත පවුල් සංස්ථාවෙහි එම අරමුණ දරුවා කුඩා කල දී ම සසුන් ගත කරවන්නට සිදු වූවකි. සාංසාරික ජීවිතය කෙටි කර ගැනීමට බෞද්ධාගමිකයින්ට සසුන්ගත වීම අරුමැසි හෝ ප්‍රතික්ෂිප්ත කරුණක් නො වේ. එහෙත්, පවුලේ ඇති වන ගැටලුවලට විසඳුමක් ලෙස දරුවන් නිසි පරිදි හදා වඩා ගැනීමට නො හැකි වීමෙන් කුඩා දරුවන් සසුන්ගත කිරීම සසුනට හෝ දරුවන්ට නිසි ඵලදායීතාවක් ලබා ගැනීමට ඇති අවකාශය සීමිත ය. න්‍යෂ්ටික පවුල් ක්‍රමවේදයේ ප්‍රධාන ගැටලුවක් ද රචිකාව අවධානයට යොමු කරවයි. දරුවන්ට නිසි පරිදි රක්ෂණාවරණයක් හෝ ආදරය, සෙනෙහස නො ලැබීම, නිසි වර්ධනයක් නො වීමෙන් අනාගත ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වෙයි.

දෙනදා සොඳ රස මසවුළු කනු බැරි වී
මගෙන් තැලුම් කා හැඬු මා කිරි කැටියා
අද මා හඬවා ගොලු කර පිය සෙනෙහේ
රන් තැටියට නීරස බොජුන් සිඟා වඩිනා
(පෙරේරා, 2000)

දරුවාගේ මානසිකත්වය නිසි පරිදි සංජානනයට පියා අසමත් වෙයි. මවක මෙන් හැඟුම්බර වීම හෝ සංවේදී වීම නො වුව ද, ළමා මානසිකත්වය පිළිබඳ වටහා ගෙන ක්‍රියා කළ යුතු බව වටහා ගත් පියවරු පුතුන් පමණක් නො ව දූවරු ද සාර්ථකත්වය වෙත ගෙන ගිය අවස්ථා තිබේ. ගීතයේ දැක්වෙන පියා දරුවාට දඬුවම් කරයි. කටුක ජීවන අනුභූති මගින් දරුවාට කෙටි කලකින් ම යථාර්ථය දරා ගැනීමට සිදු වී තිබේ. සම වයසේ දරුවන් පාසල් යන විට, මව්- දෙමව්පියන් සෙවණෙහි සෙනෙහස ලබන විට, උණුහුමට ගුලි වී උදැසන නිදා ගන්නා විට මෙම දරුවා පැවිදි ව පාත්‍රයක් ගෙන පිඬු පිණිස වැඩම කරන්නේ ය. නිරස බොජුන් වළඳන්නේ ය. පියාගෙන් අහිමි වූ සෙනෙහස දරුවාගේ නික්මීමට හේතු වන්නට ඇත. සමාජ, ආර්ථික තත්ත්ව ඒක මාතෘ හෝ පිතෘ දරුවෙකුට නිසි පරිදි රැකවරණය ලබා දීමට අවකාශයක් ලබා නො දෙයි. දරුවාගේ අවශ්‍යතා පූරණය නො කරන තථ්‍ය යථාර්ථය කිවිඳිය සංයමයෙන් යුතු ව ගීතයෙන් විග්‍රහ කරයි.

අප්‍රකාශිත ව හදවතේ රඳවා ගෙන දරුවන් උණුහුම් කරන පිය සෙනෙහස පිළිබඳ ව "පුදුම පිය පදවිය" ලෙස යමුනා මාලනී පෙරේරා සිය "සුවඳ මට දී" කෘතියෙහි දක්ව යි.

ඉර හඳට හොරෙන්
තරු යන හැටි ගිලිහී දුර අහසින්
හද ලෙනෙහි මගේ
සිටි දියණිය පිටවේ (පෙරේරා, 2005)

පිතෘත්වය දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් දිවි පරදුවට තබයි. විවාහය දියණියක පවුල් සංස්ථාවෙන් වෙන් වීමේ අවස්ථාව යි. ඇයට නිදහස්

ජීවිතයක් ලබා දීමට පියවරු කැපවෙති. එහෙත්, විවාහයෙන් පසු ජීවිතයේ යථාර්ථය සංකීර්ණ හෙයින් ඇය කෙරෙහි සංවේදී වෙයි.

පිය සිතක තියෙන සෙනෙහේ
මුතු කඳුළු කරනු බැරිවේ (පෙරේරා, 2005)

පියා වේදනාව දරා ගන්නවා මිස හඬා කඳුළින් දුක බැහැර නො කරන බව පොදු සත්‍යයකි.

දුව කුසිනි වදන දිනයේ
මව විඳින දුකට වැඩියේ
දුව සරණ බඳින දිනයේ
පිය සිතට දැනෙයි දියණී
හරි පුදුමයි පිය පදවී (පෙරේරා, 2005)

ලොව විශාලතම වේදනාව දරුවෙකු බිහි කිරීම ලෙස විද්‍යාත්මක ව තහවුරු වූ සත්‍යයකි. දරු සෙනෙහස වෙනුවෙන් බිහි වූ දරුවා දැකීමෙන් මවගේ සිත වේදනාව මැඩගෙන සතුටක් ජනිත වෙයි. එහෙත් ඇසක් මෙන් ආරක්ෂා කළ දියණිය ජීවිතයේ සුවිශේෂ අවධියකට එළඹෙමින්, තම උණුහුමින් දුරස් වන විවාහය ජීවිතයේ සිදු විය යුතු කරුණක් වුව ද ඇයගේ ආරක්ෂාව පිළිබඳ ඇති අවදානම, ජීවන අභියෝග දකින පියා මවක් දරුවා බිහි වන දින දැරූ වේදනාව අභිභවා ගිය දුකක් දරයි. ඇතැම් එබඳු අවස්ථා දරා ගත නො හැකි ව පියවරු මානසික ව්‍යාකූලතාවලට පවා පත් වී තිබේ. පිතෘත්වය එතරමට ම තම දරුවන් කෙරෙහි සංවේදී ය. හුදෙක් දියණිවරු පමණක් නො ව තමන්ට දාව බිහි වූ සෑම දරුවෙකු වෙනුවෙන් ම එසේ ය.

මාතෘ-පිතෘ සෙනෙහස ජීව විද්‍යාත්මක තත්ත්වයක් ලෙස වෛද්‍ය විද්‍යාව ද දක්වන්නකි. ආසියානු සමාජයේ ස්ත්‍රිය පිළිබඳ පවතින ආකල්පය ගීත රචකයින් සිය රචනාවලින් ඉස්මතු කරන්නේ අනායාසයෙනි. සමාජ දේහයේ මුල් බැස ගෙන ඇති හර පද්ධති විසින් මෙහෙය වන ගීත රචකයා ද සමාජය ආශ්‍රයෙන් අනුභූති උත්පාදනය කර ගන්නා බවට මෙය ම සාක්ෂ්‍යයකි. ස්ත්‍රියකගේ චරිත ලක්ෂණ අතර ඇයගේ කායික සහ

චෛතසික දුර්වල බව බොහෝ අවස්ථාවල නූතන සමාජයේ ද ඇය කෙරෙහි පවතින ඍණාත්මක ආකල්ප රැසකට පසුබිම් සාධකය යි.

පිය මහ රජු ඔබමයි
අප දිවි රජ දහනේ
අප වෙනුවෙන් දිවි කැප කළ
පිය මහ රජුනේ
ඔබෙ සෙනෙහස කිරි සුවඳක්
සේ ළඟ රැඳුණේ (පෙරේරා, 2010)

නූතන ගායකයින් විසින් ද ගායනා කරන 'මගේ ලෝකෙ රජ්ජුරුවෝ ඔබයි තාත්තේ' යන්න මින් වක්‍රව දක්වයි. පිය මහ රජු ලෙස යොදන ආමන්ත්‍රණය තේජවන්ත පිතෘත්වය ප්‍රතිනිර්මාණය කරයි. රාජ්‍යත්වය සිංහලයාගේ ඔද තෙද දරන සියලු ශක්තියෙන් සපිරි ආරක්ෂකයා ලෙස සැලකීමට අද්‍යතනයේ පවා දක්වන්නේ ඉහළ ප්‍රියත්වයකි. පියා ජීවිත රජ දහනේ රජු ලෙස හඳුන්වන්නේ පවුලේ ප්‍රබලතම රැකවරණය පියාගෙන් සැලසෙන හෙයිනි. ආදරය, සෙනෙහස දරුවන් වෙනුවෙන් ක්ෂීරය නො ඉපදවූ ව ද, ජීවිතය ජීවත් කරවන සෙනෙහස දරන්නේ ය. ගීතය රචනා කරන්නේ රචිකාවක වීම ද ගීතයේ වස්තු විෂයාත්මක විශේෂතාවක් ඇති කරන්නේ පියා සහ දූවරු අතර ඇති ආධ්‍යාත්මික සම්බන්ධතාව නිරූපණයට උත්සාහ කරන බැවිනි.

අනන්තවත් මා ඔබ හට බාලේ
දුක් ගිනි දෙන්න ඇතී
යොවුන් වියේ මගේ සිතුම් පැතුම්
ඔබෙ සිත රිදවන්න ඇතී
නොසැලෙන පිය ගුණ මහ කරුණාවෙන්
අදත් මගේ හිස පිරිමදිනා
මා පියාණනේ (පෙරේරා, 2010)

දරුවන් දැනුවත් මෙන් ම, නො දැනුවත් ව සිදු කරන වැරදි ක්‍රියා පවුල් සංස්ථාවේ සමාජානුයෝජන දෝෂයක් වශයෙන් සමාජය අර්ථකථනය

කරයි. එහෙත්, වැරදි කළ දරුවා නිවසින් බැහැර කර හෝ අමානුෂික කායික මානසික දණ්ඩනයට ලක් කිරීම නූතන පියාගේ කාර්යය නො වේ. දරුවන් පිය සිත කනගාටුවට පත් කළ ද, සිව්බඹ විහරණයෙන් යුතු පියවරු දරුවන්ට කාරුණික වෙති. වර්තමාන දරුවන්ගේ විවිධ සාවද්‍ය චර්යා මිතුරු කණ්ඩායම් ආදියෙන් උගත් අසැබි චර්යා රටාවලින් වළක්වා ගැනීමට දඬුවම් කළ යුතු ව ඇත. ගීතයේ දැක්වෙන තරමින් නිසි පරිදි හැඩගැසෙන දරුවා වෙනුවෙන් කාරුණිකත්වය පතුරන්නේ අභිමානයෙනි. දරුවා සුමගට ගත නො හැකි වූයේ නම් සිත පීඩාවට පත් වීම සෙනෙහස ගීතයේ පරිදි නො සැලී තිබෙන්නක් නො වේ.

උක්ත ගීතයේ රචිකාව ස්වකීය අනුභූතියක් හෝ පාර්ශ්වීය අනුභූතියක් නිරූපණය කිරීමට උත්සුක වෙයි. ඇයට ගෝචර වූ පිතෘ භූමිකාව ආනුභවික සංකල්ප රූප ස්ථරයකින් යුතු ව ගීතයේ සංරචනය කර තිබේ. කතිකාමය ස්ථරයේ යථාර්ථය සුන්දර සංකල්පනා පමණක් අන්තර්ගත වූවක් නො වේ. කෝපය, වෛරය මෙන් ම පුරුෂයාගේ දෘඪ බව හේතුවෙන් දරුවන් අමනාප කරවන අවස්ථා ද වෙයි. ස්ත්‍රියක වන මාතෘත්වයට පවා නිගරු කරවන පියවරු පිතෘත්වයේ උත්තම බව ද කෙලෙසති. මෙම ගීත පද රචනාවෙන් පිතෘ භූමිකාවේ යථාර්ථය අභිභවා පිතෘත්වයේ සෞන්දර්යාත්මක දාරක බන්ධුත්වය ප්‍රතිනිර්මාණය වී ඇත. පියා පුරුෂයෙකුගේ දැඩි බව දැරුව ද දරුවන් ඉදිරියේ සෙනෙහස බෙදාදෙන්නෙකි.

ජයක් ලැබුණ දා මා ජීවිතයේ
ඔබ මා ළඟ නොමැතී
දුකින් රිදෙන සිත සුවෙන් සදන්නට
ඔබ මිය යන්නට ඇතී
නොනිමෙන පිය ගුණ මහ වරුසාවෙන්
අදත් මගෙ සිත නිවනු මැනේ
ම පියාණනේ (පෙරේරා, 2005)

දරුවන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් පියවරු අසීමිත ව කැප කිරීම් සිදු

කරති. මව්වරු මෙන් ම ලාභාපේක්ෂාවකින් තොර ව පියවරු සිදු කරන කැප කිරීම්වල ප්‍රතිඵල මල් ඵල ගැන්වුණු දා දියණියගේ සතුට විඳින්නට පියා නොමැති ය. අභාග්‍ය සතුටෙහි සැබෑ හිමිකරු, සැබැවින් ම සතුටු වන පියාගේ අගය රික්තය මනාව සිතට දැනෙන මොහොතකි එය. පියා මිය යාම තමන්ට දුකක් ගෙන දෙන්නේ වුව ද එය පියාට සැනසීමක් යැයි සිතා වේදනාව දරා ගැනීමට උත්සාහ කරයි. දරුවන් සහ පියා අතර ඇති ආධ්‍යාත්මික ගනුදෙනුව සංවේදී ව ප්‍රතිනිර්මාණය කරයි.

මානව සබඳතාවල ස්නිග්ධතාව ව්‍යාකූල සමාජ පසුබිමෙහි ගොඩ නැගෙන්නක් හෙයින් රළු කටුක බවක් ද එහි ආලිප්ත ව ඇති බව ගීත මගින් නිරූපණය වන්නකි. මානව භාව සුරක්ෂිත කිරීමෙහි ලා ස්නිග්ධතාව ආයාසයෙන් ජීවිතානුබද්ධ කිරීමට සාහිත්‍යකරුවන්ට සිදු වීම කනගාටුවට කරුණකි. සෑම සමාජයක ම පාහේ සම විෂමතා විද්‍යමාන වීම ස්වභාවය යි. එහෙත්, විෂමතා සුලබ වීම සමාජ සංවර්ධනය ඌනනය වීම සන්නිවේදනය කරන්නක් බව විශේෂයෙන් කිව යුතු නො වේ. ගී පද රචකයින් අවිශේෂයෙන් දක්වන අවර ගණයේ සමාජ දිශානතිය වෙත බොහෝ දෙනෙක් යොමු වීම කෙරෙහි හුදෙක් පුද්ගල බද්ධ කරුණු හෝ හේතූන් පමණක් නො ව පොදු සමාජ සචලතා ද හේතු විය. ධනාත්මක පුද්ගල භාව ස්ථාපනය කරමින් පුද්ගල විභවතා ගොඩ නැගීමෙහි ලා සමාජය ද සුබ විහරණයෙහි ලා අවකාශ සම්පාදනය කරන්නක් වීම යෝග්‍ය ය.

යමුනා මාලිනී පෙරේරා සිය මා නෙතු මග හැර කෘතියේ දක්වන ගීතයෙන් සමාජයක් අපේක්ෂා කරන දෙමව්පිය අභිලාෂය කැටි කොට දක්වා ඇත.

සඳ පිරිලා එයි දෝරේ
කිරි එරිලා හඳපානේ
අහසේ තරු කැට වාගේ
පුතුගේ සිනහව වාගේ (පෙරේරා, 1995)

දෙමව්පියන් බලාපොරොත්තු වෙන්නේ දරුවන්ගේ සිනහව ය. අහසේ

තරු, සඳ එළිය පුතුගේ සිනහව වාගේ ය. සිනහව සෞම්‍ය ය. ලෝකයට අවශ්‍ය වන්නේ නිවුණු මිනිසුන් ය. ශික්ෂිත මිනිසුන් ය. සඳ, කිරි මගින් සංකේතවත් කරන්නේ එකී සුමට බව ය.

හඳ මාමා සිල් ගන්නා
තරු නවගුණ වැල ගැන්නා
බුදු බණ පොත කියවන්නා
පුතුට පිරිත් පැන් දෙන්නා (පෙරේරා, 1995)

රචකයා සිය ගීතයට පසුබිම් කරගෙන තිබෙන්නේ බෞද්ධාගමික කරුණු ය. "හඳ මාමා" ළමා ලෝකයේ සමීපතමයෙකි. "හඳ", යන නාමය "හඳ මාමා" ලෙස ආමන්ත්‍රණය කරන්නේ සමීප බව වඩාත් අර්ථවත් කරමිනි.

සාම්ප්‍රදායික පිතෘ භූමිකාවේ ආකෘතියෙහි පියාගේ අදහස් සහ හැඟීම් ප්‍රකාශනය මවට වඩා වෙනස් ස්වරූපයක් ගනියි. පුරුෂයෙකුට පවරන ලද දෘඩ බව පවත්වා ගැනීම ද සමාජය බලාපොරොත්තු වෙයි. දරුවන් කෙරෙහි පියෙකු සතු ආදරය, සෙනෙහස අසීමිත වුව ද එය අප්‍රකාශිත ව පවත්වා ගැනීම සමාජ සම්මතයේ ඇගයීමට ලක් කරයි. මවට හඬන්නට තිබෙන අයිතිය පියාට අහිමි වන්නේ එහෙයිනි. පුරුෂාධිපත්‍ය සමාජයක පියාගේ භූමිකාව මෙසේ විය යුතු යැයි පවතින සම්මත ආකෘතියක් පැවතීම මෙයට හේතුව යි. න්‍යෂ්ටික පවුලේ මව සහ පියා ප්‍රධාන චරිත යුගලය යි. පියා පවුලේ ගෘහ මූලිකයා ය. එකිනෙකාට පැවරෙන සහ එකිනෙකාගෙන් ඉටු වන විෂම වූ සේවා සහිත න්‍යෂ්ටික පවුලෙහි සාමාජිකයන් වෙනුවෙන් විකල්ප දුර්ලභ ය. විස්තෘත පවුලක පියාගේ වියෝවෙන් පසු පියාගේ සහෝදරයෙකු පියාගෙන් පවුලට ඉටු වූ වගකීම් ඉටු කිරීමට බැඳී සිටි අවස්ථා ද විය (පීරිස්, 2005). නැතහොත් වෙනත් වැඩිහිටියෙකු දරුවන්ගේ අවශ්‍යතා ඉටු කරයි. එහෙත් න්‍යෂ්ටික පවුලක වෙන් වෙන් වශයෙන් කුටුම්භ ලෙස සකස් වී වාසය කිරීම හේතුවෙන් ව්‍යතිරේක වශයෙන් සබඳතා ගොඩ නගා ගැනීම ද දුර්ලභ ය. ගීත රචකයා මෙම ගීතයට ඇතුළත් කර ඇත්තේ ද එබඳු සත්‍යය සිදුවීමක් ඇසුරින් ගොඩ නගාගත් අනුභූතියකි.

චන්ද්‍ර මණ්ඩලේ සැතපුණු සා රුවක් නොවේ

ඔබේ මුහුණ මැවී පෙනෙයි
මට පියාණනේ
මීදුමෙන් තෙමී නැහැවුණ
චන්ද්‍ර යානතේ
පාලු නැති ද නිදා ඉන්න විට
පියාණනේ (විජේසිංහ, 2018)

පියා ජීවිතයෙන් සමු ගෙන ය. දියණියක ලෙස තම පියාගේ වියෝවෙන් රික්තයක් වූ පවුලේ හුදෙකලාව මධ්‍යයෙහි පියාගේ සෙවණැල්ල සිහි කරයි. ඇයට පියා නික්ම යාම දරා ගත නො හැකි ය. ජීවිතය සහ මරණය අතර වෙනස සහ අනිත්‍ය බව වටහා ගත හැකි විඥානයක් නො මැති දරුවෙකු නො වූව ද ඇය උක්ත සිදුවීම අභියස ළදරුවෙකු වන්නේ තම පියා ඉදිරියේ ය. කෙතරම් වියපත් වුවත් තම දෙමව්පියන්ට දරුවන් දරුවන් ම ය. තමන්ට පියාගේ වියෝගයෙන් පසු ව දැනෙන නිවසේ හුදෙකලාව දරා ගැනීමට අපහසු තරමට උග්‍ර ය. න්‍යෂ්ටික පවුලක දුක-ශෝකය බෙදා හදා ගැනීමට ඥාති හිත මිතුරන් සිටින්නේ ද විශේෂ අවස්ථාවක දී කෙටි කලක් පමණි. අවමංගල්‍ය අවස්ථාවක දී හෝ කෙටි දින කිහිපයක් පමණක් රැඳෙන ඔවුන් තම තමන්ගේ වෘත්තීන් හෝ වෙනත් අවශ්‍යතා සඳහා පිට වන්නේ කාර්ය බහුල සමාජය පුද්ගල සංගමය සීමා කර ඇති හෙයිනි. බැහැරින් පැමිණියවුන් නික්ම ගිය පසු යථාර්ථය සමග ගැටෙන පුද්ගලයන්ට ප්‍රශ්නය විසඳා ගැනීමට යෝග්‍ය මානසිකත්වයක් ගොඩ නගා ගැනීමට ද විවිධ උත්සාහ දැරීමට සිදු වෙයි. මෙම දියණිය පත් වී ඇත්තේ ද එවන් තත්ත්වයකට ය.

ගීතවත් භාෂාවක් ඔස්සේ රචිත ගීතයකි. රචකයා ගීත බණ්ඩයේ අන්තරා කොටසේ දී අස්වාභාවික තත්ත්වයක් නිරූපණය කරයි.

ඔබේ සුවඳ පිරුණු ගෙදර
පාලු කාමරේ
කියාදෙන්න කියාදෙන්න
මට පියාණනේ

මේ තරම් නපුරු
හීනයක් ද ජීවිතේ (විජේසිංහ, 2018)

න්‍යෂ්ටික පවුලක ප්‍රධාන ම අභියෝගය බවට පත් වන්නේ එක් සාමාජිකයෙකු හෝ වියෝ වීම නිසා සමස්ත පවුල් සංස්ථාවෙහි ම සාමාන්‍ය ආකෘතිය සහ ක්‍රියාකාරීත්වය වෙනස් වීම යි. දරුවන්ට පියෙක් හෝ මවක් හෝ පවුලට දරුවෙකු අහිමි වීම සමස්ත පවුලෙහි ම සංයුතියට පමණක් නො ව ක්‍රියාකාරීත්වයට ද දැඩි අභියෝගයක් වෙයි. කායික, මානසික වශයෙන් පමණක් ම නොව සමාජයීය වශයෙන් ද එය බලපෑම් ඇති කරන්නකි. න්‍යෂ්ටික පවුලක සෑම සාමාජිකයෙකුගේ ම භූමිකා අත්‍යවශ්‍යය ය. එකිනෙකා කෙරෙහි පවතින බැඳීම රික්තයක් වන තරමට ම එක් සාමාජිකයෙකුගේ වියෝව සදාතනික ශෝකයක් ම වෙයි. පියාගේ වියෝ වීම නිසා දුවක විඳි කටුක මතක සහ මානසික තත්වය රත්න ශ්‍රී තම ගීතයේ වස්තුවිෂය බවට පත් කර ගෙන ඇත.

7. නිගමනය

මාතෘත්වයට සාපේක්ෂ ව අභියෝග මධ්‍යයේ දරුවෙකු සුරක්ෂිත කරන පිතෘ භූමිකාව වෙනස් අයුරින් නිරූපණය කර තිබේ. ගීත රචකයින්ට සාපේක්ෂ ව යමුනා මාලිනී පිතෘ භූමිකාව නිරූපණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබේ. ඇය ස්වාමි- භාර්යා සබඳතාවයෙහි ප්‍රකට නො කළ ස්ත්‍රී කාරකත්වය පිතෘ භූමිකාව ප්‍රතිනිර්මාණයේ දී යොදා ගෙන ඇත. පිතෘත්වය තේමා කර ගත් ඇගේ ගීතවල යථාර්ථ නිරූපණය විෂයයෙහි සුලබ අවකාශයක් ඉන් විවර වී තිබේ.

නූතන සමාජ සංසිද්ධි හේතුවෙන් පවුල සහ මානව සම්බන්ධතා ව්‍යුහාත්මක ව න්‍යෂ්ටික ස්වරූපයක් ගැනීම ද, කාර්යමය විස්තෘතිය අනුව සීමිත මානව සම්බන්ධතා කිහිපයක් තුළ කාර්ය කොටස් රැසක් පවත්වා ගනිමින් පවුලේ උපයෝගීතාව අභියෝගයට ලක් වන අවස්ථා අද්‍යතන සිංහල සමාජයේ පැවති බව ද නිරීක්ෂණය විය පවුලේ කේන්ද්‍රීය සම්බන්ධතාව ලෙස සමාජ විද්‍යාඥයින් අර්ථ දක්වන පිතෘ භූමිකාව

ගීතයෙන් ප්‍රතිනිර්මාණය කර ඇති ආකාරය තුලනාත්මක ව විග්‍රහ කෙරිණි. ගීත රචක සුනිල් සරත් පෙරේරා කලාත්මක සහ ආනුභවික තත්වයන්ට අවධානය යොමු කරන අතර රත්න ශ්‍රී විජේසිංහ සහ ගීත රචිකාව වූ යමුනා මාලිනී පෙරේරා කලාත්මක සහ ආනුභවික තත්ත්වයන්ට ප්‍රමුඛතාව ලබා දෙමින් කතිකතා සංකල්ප ඔස්සේ තථ්‍ය යථාර්ථය ප්‍රතිනිර්මාණයට නැඹුරු වූ බව නිරීක්ෂණය විය.

8. මූලාශ්‍රය


ප්‍රාථමික මූලාශ්‍රය

පෙරේරා, යමුනා මාලිනි (1995). *මා නෙතු මග හැර.* කොට්ටාවඃ සාර ප්‍රකාශන.

පෙරේරා, යමුනා මාලිනි (2005). *සුවඳ මට දී.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, සුනිල් සරත්. (2010). වන මඬලේ බිසවු. නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

විජේසිංහ, රත්න ශ්‍රී (1998). *ගංගා ගීතය.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, රත්න ශ්‍රී (2018). *මිණි බැඳි දොර.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

ද්විතියික මූලාශ්‍රය

අබේසිංහ, මයුරි (2017). *ගීත රචනා කලාවේ විකාශනය.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

අමරකීර්ති, ලියනගේ (2017). *නව කවි සලකුණ.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

ආරියරත්න, සුනිල් (2005). නූතන ගේය කාව්‍ය සංහිතා. (සය වන මුද්‍රණය-2018). කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

පුවත්පත්

63. ආනන්ද, උඩුහාවර (2013, සැප්තැම්බර් 12). ප්‍රායෝගික ජීවිතයට බුදු දහම 05- මව්පිය දූ දරු සබඳතාව, කියෙව්වේ http://www.budusarana.lk/budusarana/2013/09/12/tmp'asp?ID=vision06

ශාස්ත්‍රීය සඟරා

සඳරුවන් කේ.ඩී එම්; විජේවර්ධන බී. වී. එන්.; ප්‍රේමරත්න, එල්.ඩී. එම්. (2017-දෙසැම්බර්). *ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ පුරුයන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සඳහා බලපානු ලබන සාධක පිළිබඳ අධ්‍යයනයක්:* Proceedings of 7th International Symposium" SEUSL (628-634)' කියෙව්වේ https://www.sab.ac.lk